# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2251/54 – 2021 ඔක්තෝබර් 29 වැනි සිකුරාදා – 2021.10.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පාමංකඩ නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කිරුළපන (කොට්ඨාස අංක 41, කිරුළ, කොළඹ මහනගර සභා සීමාව තුළ) ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක CO/THI/2019/374 හා 2019.12.11 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

**01. කැබලි අංක 01 – වරි. අංක 10 (කොටසක්) බලපොකුණ පුරාණ විහාර පාර – ප්‍රමාණය: හෙක්. 0.0175**

උතුරට: 4 වන පටුමග, බලපොකුණ පුරාණ විහාර පාරේ වරි. අංකය සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි ඉඩම සහ බලපොකුණ පුරාණ විහාර පාරේ වරි. අංක 10 (කොටසක්) දරන ඉඩම; නැගෙනහිරට: බලපොකුණ පුරාණ විහාර පාරේ වරි. අංකය සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි ඉඩම සහ බලපොකුණ පුරාණ විහාර පාරේ වරි. අංක 10 (කොටසක්) දරන ඉඩම; දකුණට: දුටුගැමුණු වීදියේ වරි. අංක 79 දරන ඉඩම; බටහිරට: දුටුගැමුණු වීදියේ වරි. අංක 79 දරන ඉඩම සහ 4 වන පටුමග.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/6/2016/HW/322.
2021 ජනවාරි මස 26 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11 – 224

1A – G 35216 – 15 (2021/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*